සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
# නාට්‍ය හා රංගකලාව - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයː |
|---|

සැලකිය යුතුයි ː
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙ හි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i)
බෙරකරු : පිරිසිදු වෙන්න තැනක් සොයා ගන්න එහෙනම් බැරි වෙන්න ඇති
යක්දෙස්සා : ඔය විදියට යනකොට මූට පිරිසිදු වෙන්න තැන් හතක් විතර හම්බ වුණා.
බෙරකරු : ඒවා සේරම කිලි ගෙවල් වෙන්න ඇති.

(ii)
ගුරුන්නාන්සේ : එයි ඔයාට සිංහල තේරෙන්නේ නෑ. ඉංග්‍රීසියෙන් අහපන් යන්නේ කොහේද කියලා.
ඇඳුරා : ඉංග්‍රීසියෙන් යන්නේ කොහේද?
බමුණා : (ගෙය දෙසට හැරී එහි වාඩි වී සිටින අයට) ඔන්න ඔය දෙර මුල්ලෙන් අයින් වෙන්නලු.

(iii)
යකැදුරා : පැදුරු වියන්න කොහේද යන්නේ?
ගුරුන්නාන්සේ : පන් උගුල්ලන්න යන කොට මොනවද ගෙනියන්නේ?
යකැදුරා : දෙල් තම්බල මුළක් බැදගෙන යනව. (මිනිහට) එහෙනම් අපි පන් උගුල්ලන්න යමු.

(iv)
පනික්කලේ : මම ද ආයිබෝවන්ඩ?
කාරියකරවන රාළː ඔව්
පනික්කලේ : රාජකාරියක් උඩින් ආව නොවැ. හඃ හා (සිනා) රාජකාරියක් උඩින් වෙන්න බැහැනේ.

(v)
තේගිරිස් : ඒත් මට බැහැ ඕන නම් අම්මත් එක්ක යන එකයි.
සරා : අම්මයි මායි කොහොමද යන්නේ පිරිමියෙක් නැතුව? එහෙනම් මල්ලිත් එක්ක යන්නම්.
තේගිරිස් : මල්ලිත් එක්ක! ඕන එකෙක් එක්ක යන එකයි.

01. ඉහත සඳහන් (i) වැනි සංවාද ඛණ්ඩය අයත් වන්නේ කවර ශාන්තිකර්ම / පූජාකර්ම විශේෂයකට ද?
(1) රටයකුමට යි. (2) කොහොඹා කංකාරියට යි.
(3) සන්නි යකුමට යි. (4) දොරකඩ අස්නයට යි.

02. ඉහත සඳහන් (ii) වැනි සංවාද ඛණ්ඩය අයත් වන්නේ,
(1) ආලවක දමනයට ය. (2) සන්නි යකුමට ය. (3) සූනියම් යාගයට ය. (4) දෙවොල් මඩුවට ය.

03. ඉහත සඳහන් (iii) වැනි සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යමය පෙළපාලිය වන්නේ,

(1) කපු යක්කාරියට ය. (2) දොළහා පෙළපාලියට ය.

(3) පැදුරු උපතේ කවිවලට ය. (4) පැදුරේ දපවිල්ලට ය.

04. ඉහත සඳහන් (iv) වැනි සංවාද ඛණ්ඩය ඇතුළත් ශාන්තිකර්මය / ගැමිනාටකය වන්නේ,

(1) සන්නි යකුමට ය. (2) සොකරි වලට ය. (3) රටයකුමට ය. (4) කෝලම් වලට ය.

05. ඉහත සඳහන් (v) වැනි සංවාද ඛණ්ඩය අයත් නාට්‍යය වන්නේ,

(1) මූදු පුත්තු ය. (2) සෙක්කුව ය. (3) කැලණි පාලම ය. (4) මෝදර මෝල ය.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06. ''නාට්‍ය යනු ජීවිතයේ පැතිකඩකි.'' යනුවෙන් නිර්වචනය කරන ලද්දේ,

(1) විලියම් ශේක්ෂ්පියර් ය. (2) බර්නාඩ් ෂෝ ය.

(3) ඇරිස්ටෝටල් ය. (4) ඇලඩයිස් නිකෝල් ය.

07. මුහුණින් දක්වන ඉරියව් කිසියම් සම්මත රටාවකට අනුව ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) ලෝකධර්මී නාට්‍යවලය. (2) නූර්ති නාට්‍යවලය.

(3) නාට්‍යධර්මී නාට්‍යවලය. (4) ජන නාට්‍යවලය.

08. නාට්‍යක ආතතිය ඇතිකරවමින් කුතුහලයෙන් පිරි රසවින්දනයක් ගෙන දෙන්නේ,

(1) නාට්‍ය ආරම්භයේ දී ය. (2) නාට්‍ය අවසානයේ දී ය.

(3) නාට්‍ය විකාශනයේ දී ය. (4) ගැටුම් අවස්ථාවේ දී ය.

09. අර්ථයක් හෝ භාවයක් ප්‍රකාශවන තාලාන්විත නර්තනාංගය වන්නේ,

(1) නෘත්‍යවලට ය. (2) නෘත්තවලට ය. (3) නාට්‍යවලට ය. (4) නෘත්‍ය නාටකවලට ය.

10. 'නව හිරු උදාව' සැමරීම සඳහා විශේෂ වතාවත් පවත්වනු ලබන උත්සවය වන්නේ,

(1) දීපවාලී උත්සවය (2) රාමසාන් උත්සවය

(3) සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය (4) තෛපොංගල් උත්සවය

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තනය / අනුවර්තනය | මෙරට නිෂ්පාදකයාගේ නම |
|---|---|---|---|
| ද ඩ්‍රැගන් | 'ක' | මකරා | ධර්මසිරි බණ්ඩාරනායක |
| 'ච' | ප්ලෝටස් | කඹය | බන්දුල ජයවර්ධන |
| අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් | ටෙනසි විලියම්ස් | 'ට' | ධම්ම ජාගොඩ |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හිතහොඳ අම්මණ්ඩී | 'ත' |
| ඇපල් කාර්ට් | බර්නාඩ් ෂෝ | 'ප' | පියදාස නිශ්ශංක |

11. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,

(1) ඉයුජින් අයොනෙස්කෝ (2) එව්ගිනි ෂ්වාට්ස්

(3) සැමුවෙල් බෙකට් (4) ගාර්ෂියා ලෝර්කා

12. ඉහත වගුවේ 'ච' කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතිය වන්නේ,


(1) රූඩන්ස් (2) ද එල්ඩර් සන් (3) පබ්ලික් එනිමි (4) ද ෆාදර්

13. ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තනය / අනුවර්තනය වන්නේ,
(1) බෙරහඬ (2) අහස් මාළිගා (3) මහගෙදර (4) වෙස් මුහුණු

14. ඉහත වගුවේ 'ත' කොටුවට ඇතුළත් විය යුතු නිෂ්පාදකයාගේ නම වන්නේ,
(1) රංජිත් ධර්මකීර්ති (2) සුනන්ද මහේන්ද්‍ර (3) සුගතපාල ද සිල්වා (4) ප්‍රසන්න විතානගේ


15. ඉහත වගුවේ 'ප' කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තනය / අනුවර්තනය වන්නේ,
(1) සයුරෙන් ආ ළඳ (2) ඇපල් කරත්තය (3) සකල ජන (4) මැටි කරත්තය

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.**


'ක'


'ච'


'ට'


'ත'


'ප'

16. දයා වයමන්ගේ 'අම්මයි පුතයි' වේදිකා නාට්‍යයෙන් වේදිකාවට අවතීර්ණ වූ රූපණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන ඡායාරූපය වන්නේ,
(1) 'ක' ය. (2) 'ට' ය. (3) 'ත' ය. (4) 'ප' ය.

17. 'අසූ එක අනූ එක' නාට්‍ය උළෙල හා සම්බන්ධ රූපණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන ඡායාරූපය වන්නේ,
(1) 'ප' ය. (2) 'ත' ය. (3) 'ට' ය. (4) 'ච' ය.

18. 'තුන්වැනි සීනුව' නාට්‍ය උළෙල හා සම්බන්ධ රූපණ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන ඡායාරූපය වන්නේ,
(1) 'ච' ය. (2) 'ප' ය. (3) 'ත' ය. (4) 'ට' ය.

19. වසර විස්සකටත් වැඩි කාලයක් මනමේ කුමරු ලෙස රංගනයෙන් දායක වූ රූපණ ශිල්පියා දැක්වෙන ඡායාරූපය වන්නේ,
(1) 'ක' ය. (2) 'ච' ය. (3) 'ත' ය. (4) 'ට' ය.

20. 'කැලණි පාලම' නාට්‍යයට රංගනයෙන් දායක වූ රූපණ ශිල්පීන් දැක්වෙන ඡායාරූප වන්නේ,
(1) 'ක' හා 'ප' ය. (2) 'ත' හා 'ප' ය. (3) 'ට' හා 'ප' ය. (4) 'ක' හා 'ට' ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**


21. සෑම අංගයක් ම සොකරි නාටකය හා සම්බන්ධ වන්නේ,
(1) සරල වෙස්මුහුණු, කාරියකරවනරාළ, තානායම් පොළ, කිට්සන් ලාම්පු
(2) කමත, සරල වෙස්මුහුණු, පත්තිනි ඇඳහිල්ල, වඩුරාළ
(3) අනුරූපණය, පත්තිනි ඇඳහිල්ල, කිට්සන් ලාම්පු, කරළිය
(4) කරළිය, පොතේගුරු, සොකරි අම්මා, කමත

22. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මැණික් පාල බිසව හා සම්බන්ධ කතා පුවත කෝළම් උපත හා සම්බන්ධ වේ.
(2) කෝළම් නාටකවල දී හාස්‍යෝත්පාදනයේ දී සතර අභිනය ම සම්බන්ධ වේ.
(3) නිල පැලැන්තියේ දුබලතා උපහාසයට ලක් කිරීම කෝළම් නාටකයෙ හි අරමුණු හා සම්බන්ධ වේ.
(4) පරයා, සොත්තානා, හේවාරාළ, කපුරාළ කෝළම් නාටකයෙහි එන චරිත හා සම්බන්ධ වේ.

23. නාඩගම් නාට්‍යකරුවන් දැක්වෙන වරණය වන්නේ,
(1) පිලිප්පු සිඤ්ඤෝ, සී. දොන් බස්තියන්, පී. පීරිස්
(2) චාල්ස් ඩයස්, චාර්ලිස් ද ආබ්‍රෙව්, පේදුරු සිඤ්ඤෝ
(3) චාර්ලිස් සිල්වා, පැලිස් අප්පුහාමි, සී. දොන් බස්තියන්
(4) වී. ක්‍රිස්තියන් පෙරේරා, පී. පීරිස්, චාර්ලිස් ද ආබ්‍රෙව්

The National e-learning Portal for the General Education

24. පහත රූපයේ A හා B අනුපිළිවෙලින් දක්වෙන්නේ,




(1) ඉහළ දකුණ හා පහළ මැද
(2) පහළ වම හා ඉහළ මැද
(3) ඉහළ වම හා පහළ මැද
(4) පහළ දකුණ හා මැද

25. මනා සහසම්බන්ධතාවයකින් යුතුව නිර්මාණ කාර්යයට දායක විය යුතු ආනුෂාංගික ශිල්පීන් තිදෙනා වන්නේ,
(1) පසුතල අලංකරණ ශිල්පියා, වේදිකා පරිපාලක, නළුවා
(2) වෙස් මෝස්තර අලංකරණ ශිල්පියා, අංග රචන ශිල්පියා, ආලෝකරණ ශිල්පියා
(3) ආලෝකරණ ශිල්පියා, නළුවා, අධ්‍යක්ෂවරයා
(4) අංග රචන ශිල්පියා, ආලෝකකරණ ශිල්පියා, සංගීත නිර්මාණ ශිල්පියා

26. දකුණු පස ඡායාරූපයෙන් දක්වෙන්නේ,



(1) ධාරාලෝක පහන
(2) අල්ට්‍රා වයලට් පහන
(3) අනුගාමී යොමු පහන්
(4) ස්ට්‍රොබ් පහන

27. මෙම පහන හා සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) ඇතැම් විට පැන්නුම් පහන් යනුවෙන්ද හැඳින්වේ.
(2) නළුවා ගමන්කරන දිශාවට ආලෝකය යොමුකළ හැකිය.
(3) දුරස්ථ පාලකයක් මගින් හසුරුවන්ට හැකිය.
(4) ගගනිකාව ආලෝකමත් කිරීමට භාවිත කරයි.

The National e-Learning Portal for The General Education

- අංක 28 - 32 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | දොළහා පෙළපාලිය | F | ඇත් බන්ධනය | K | යුගාසන බණ |
| B | ගුරුගේ මාලාව | G | සූවිසි විවරණය | L | දරු නැලවිල්ල |
| C | මරා ඉපැද්දීම | H | තර්ගේ | M | රාමා මැරීම |
| D | කපුයක්කාරිය | I | ගබඩා කොල්ලය | N | කතා පහ |
| E | ආලවක දමනය | J | ස්ථාක්කි | O | පූර්ණ විරුදුව |

28. උඩරට ශාන්තිකර්මයට අයත් නාට්‍යමය අවස්ථා ඇතුළත් වරණය වන්නේ,
(1) B, I හා N ය. (2) A, G හා M ය. (3) D, E හා L ය. (4) H, I හා N ය.

29. ගර්භසංරක්ෂක ශාන්තිකර්මයකට අයත් නාට්‍යමය අවස්ථා ඇතුළත් වරණය වන්නේ,
(1) B, C හා I ය. (2) G, H හා N ය. (3) A, D හා L ය. (4) J, M හා O ය.

30. බෞද්ධ පූජාකර්ම ඇතුළත් වරණය වන්නේ,
(1) D, G හා L ය. (2) E, G හා K ය. (3) I, K හා N ය. (4) A, B හා I ය.

31. සේරමන් රජු හා සම්බන්ධ කතා පුවත ඇතුළත් ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථා ඇතුළත් වරණය වන්නේ,
(1) D, F හා M ය. (2) H, L හා N ය. (3) C, F හා M ය. (4) E, G හා M ය.

32. නාඩගම් හා සම්බන්ධ වරණය වන්නේ,
(1) H, J හා O ය. (2) B, H හා J ය. (3) I, N හා O ය. (4) H, M හා N ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

33. නාට්‍ය සංගීතය හා සම්බන්ධ නොවන්නේ,
    (1) තේමාවට උචිත විය යුතුය.
    (2) එක් එක් ශෛලීන්ට අනුව සංගීතය සුවිශේෂී වේ.
    (3) නාට්‍යමය අවස්ථා තීව්‍ර වන ලෙස නිර්මාණය විය යුතුය.
    (4) සිත්ගන්නා සුළු ලෙසින් රංගය අභිබවා යා යුතුය.

34. රංග වින්‍යාසය හා සම්බන්ධ නොවන්නේ,
    (1) චලන හා හැඩතල පිළිබඳ මනා අවබෝධයකින් සිදුකළ යුතු කාර්යයකි.
    (2) නළුවාගේ නර්තනමය හැකියාව මත පදනම් වූ කාර්යයකි.
    (3) වේදිකාවේ භූගෝලීය පිහිටීම පිළිබඳ මනා අවබෝධයකින් කළයුතු කාර්යයකි.
    (4) ප්‍රබල අර්ථයක් හා දෘශ්‍ය රූපයක් මැවෙන අයුරින් සිදුකළ යුතු කාර්යයකි.

- අංක 35 - 37 තෙක් ප්‍රශ්නවලට පහත සඳහන් තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A විවිධ තාක්ෂණික උපකරණ භාවිත කරයි.
B ශරීර ප්‍රමාණ හා ඡවි වර්ණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
C බාහිර සමාරෝපය හා සම්බන්ධ වේ.
D සංකේතාත්මකව ද ඉදිරිපත් කළ හැකිය.
E නාට්‍යධර්මී ශෛලියේදී 'මකුට' භාවිතය සුලභ ය.
F සම්මත වර්ණ, රේඛා හැඩතල භාවිත කරනු ලබයි.

35. අංග රචනය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
    (1) A හා E ය. (2) D හා E ය. (3) B හා E ය. (4) C හා F ය.

36. රංග භූමි අලංකරණ හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
    (1) C හා D ය. (2) A හා D ය. (3) B හා F ය. (4) C හා F ය.

37. වේෂ භූෂණ හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
    (1) D හා F ය. (2) D හා E ය. (3) B හා E ය. (4) A හා B ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

38. අභ්‍යන්තර ශිල්පක්‍රම හා බාහිර ශිල්ප ක්‍රම හා සම්බන්ධ වන්නේ,
    (1) රූපණයයි. (2) අනුකරණයයි. (3) අභිරූපණයයි. (4) සමාරෝපයයි.

A - මිස්ට කරුණාරත්න කියාපු එක ඇත්ත. මෙච්චර ඉක්මණට යන්ඩ ගිය එකයි වැරැද්ද. තව එක් පැයක්වත් කතා කර කර ඉන්ඩ ලැබුණා නම් කොච්චර අගේ ද?

39. ඉහත A හි සඳහන් සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය රඟදක්වනු ලැබුවේ.
    (1) විශ්ව විද්‍යාල කොලීජියේ නාට්‍ය සංගමය මගිනි.
    (2) විශ්ව විද්‍යාල සිංහල සමිතිය මගිනි.
    (3) විශ්ව විද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය සංගමය මගිනි.
    (4) විශ්ව විද්‍යාල නාට්‍ය වංශය මගිනි.

40. ඉහත A හි සඳහන් සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍ය නිෂ්පාදිත වර්ෂය හා එහි මුල් රචකයා වන්නේ,
    (1) 1945, නිකොලායි ගොගොල් ය. (2) 1936, ඇන්ටන් චෙකොෆ් ය.
    (3) 1954, මෝලියර් ය. (4) 1943, ඔස්කා වයිල්ඩ් ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
| --- |

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙහි වර්තමාන නිර්මාණකරුවා කවුද? (ලකුණු 02)

ii. මෙම නාට්‍යයේ කතා පුවත කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

iii. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාට්‍යධර්මී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

iv. මෙහි දක්වෙන ප්‍රධාන ගැටුම් අවස්ථාව විස්තර කරන්න. (ලකුණු 02)

v. මෙම නාට්‍යයේ පසුතලය මැවීම සඳහා ආලෝකකරණය භාවිත කර ඇති අවස්ථා දක්වන්න. (ලකුණු 02)

vi. නාට්‍ය අවසානයේ දී කාලගෝලයාගේ ගැටළුවට ලැබෙන විසඳුම පිළිබඳව ඔබගේ අදහස ලියන්න. (ලකුණු 02)

(02) i. ප්‍රාසාංගික කලාව යනු කුමක් ද? (ලකුණු 02)

ii. ප්‍රාසාංගික කලාවේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 04)

iii. නාට්‍යකලාව ප්‍රාසාංගික කලාවක් ලෙස සුවිශේෂී වන්නේ කෙසේ ද? (ලකුණු 06)

(03) i. 'ශාන්තිකර්ම' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

ii. විශාලා මහනුවර ඇති වූ තුන් බිය හා සම්බන්ධ ශාන්තිකර්මය නම් කර එහි නාට්‍යමය අවස්ථාවක් උදාහරණ සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. නූතන නාට්‍ය කලාවට ශාන්තිකර්මවලින් ලැබී ඇති පිටිවහල පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(04) i. රංග ක්‍රීඩා යනු කුමක් ද? (ලකුණු 02)

ii. ඔබ පන්ති කාමරයේදී ප්‍රායෝගිකව රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා වල යෙදීමේදී ඔබට මුහුණ පාන්නට සිදු වූ ගැටළු 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස අතුරින් ඔබ වඩාත් රුචිකත්වයක් දක්වන්නේ කුමකට ද? එයට හේතු දක්වන්න. (ලකුණු 06)

(05) i. නාඩගම් පිරිහීම නූර්තියේ ප්‍රභවයට හේතු විය. කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. නූර්ති ප්‍රගමනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙකු නම් කර ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04)

iii. නූතන නාට්‍ය කලාවට නූර්තිවලින් ලැබූ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(06) i. 'අභිනය' නිර්වචනය කරන්න. (ලකුණු 02)

ii. ප්‍රධාන නාට්‍ය ශෛලීන් අනුව අභිනය භාවිතය වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. නළුවාගේ සමාරෝප ක්‍රියාවලිය සඳහා අභිනය උපකාරී වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(07) සාරගම ගම්මානයේ වෙසෙන මිනිස්සු මානව හිතවාදී, එකිනෙකාට ගරුකරන, සුහදශීලීබවින් හා අන්‍යෝන්‍ය සහයෝගීතාවය ආදී උතුම් මානව ධර්මයන්ගෙන් යුතු පිරිසකි. නොසිතූ මොහොතකදී පිටසක්වල යානාවක් මෙම ගම්මානයට ගොඩ බසියි. ගම් වැසියෝ ඔවුන් සුහදශීලීව පිළිගනිති. පිටසක්වල වැසියන් තුළ ඇත්තේ මෙම ගම්වැසියන්ට වඩා පරස්පර විරෝධී අදහස් ය. ඔවුන් මිනිසත් ගුණවලින් හීන වුවද නව තාක්ෂණික දැනුමෙන් පරිපූර්ණය. දිනක් ගම්වැසියන් හා පිටසක්වල වැසියන් අතර බහින් බස් වීමක් ඇතිවේ.

ඉහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩුවැඩි කරගත හැකිය.

- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)
- සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08)

(මුළු ලකුණු 12)

The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

11 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව** කාලය පැය 01 යි.

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ''අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය වර්ෂ 2016 හා ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න'' ආදර්ශ ප්‍රශ්න පත්‍ර සංගහයෙහි පිටු අංක 327 388 හි සඳහන් (50) නාට්‍ය හා රංගකලාව (සිංහල) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය ප්‍රායෝගික පරීෂණය සඳහා යොදාගන්න.

සැලකිය යුතුයි :
- ලකුණු ලබාදීමේදී ආදර්ශ ප්‍රශ්න පත්‍ර සංග්‍රහයෙහි සඳහන් නිර්ණායක හා ලකුණු දීමේ පටිපාටිය අනුගමනය කරන්න.
- පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල) ඇගැයීමේදී පහත සඳහන් නාට්‍ය පෙළ භාවිත කරන්න.

නිර්දේශිත නාට්‍ය පෙළ,

- ⋆ දික්තල කාලගෝල
- ⋆ විකෘති
- ⋆ මනමේ
- ⋆ තලමල පිපිලා

- නිර්මාණාත්මක රංග රචනය (සාමුහික) ඇගැයීමේදී අදාළ සංගීත ඛණ්ඩ සඳහා පසුගිය අ.පො.ස. (සා/පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදාගත් සංගීත ඛණ්ඩ ඇතුළත් CD තැටි භාවිත කරන්න.

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(4) | 5 -(1) | 6 -(2) | 7 -(3) | 8 -(4) | 9 -(1) | 10 -(3) |
| 11-(2) | 12 -(1) | 13 -(4) | 14 -(3) | 15 -(2) | 16 -(1) | 17 -(1) | 18 -(3) | 19 -(2) | 20 -(4) |
| 21-(2) | 22 -(3) | 23 -(4) | 24 -(1) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(1) | 29 -(3) | 30 -(2) |
| 31-(3) | 32 -(1) | 33 -(4) | 34 -(2) | 35 -(4) | 36 -(2) | 37 -(3) | 38 -(3) | 39 -(2) | 40 -(1) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) i. පුනාසේන ගුණසිංහ (ලකුණු 02)
ii. කතා පුවත කෙටියෙන් දක්වා (නිවැරදිව) ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)
iii. සංවාද භාවිතය, පොතේ ගුරුගේ චරිතය, වේදිකාව, ප්‍රවිෂ්ට වීමට හා නික්ම යාමට භාවිත කරන ගමන් තාල, අංග රචනය හා ඇඳුම් පැළඳුම් ආදී පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)
iv. ප්‍රධාන ගැටුම් අවස්ථාව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)
v. ගඟ මැවීම සඳහා ආලෝකකරණය භාවිත කර ඇති අවස්ථාව පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)
vi. ලබා දුන් විසඳුම හා එය නාට්‍යමය තේමාවට සම්බන්ධ වන ආකාරය පිළිබඳව අදහස් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(02) i. ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ජීවමානව ඉදිරිපත් කරනු ලබන කලාවයි. (ලකුණු 02)
ii. සජීවී බව, ගායනය රංගනය චලනය පදනම් කර ගැනීම, සෘජු ප්‍රේක්ෂක සහභාගීත්වය, නිශ්චිත ස්ථානයක් භාවිත කිරීම ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
iii. නාට්‍ය කලාවේ සුවිශේෂී බව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(03) i. පුද්ගලයෙකුට හෝ ගමකට, පොදුවේ හෝ පෞද්ගලිකව සෙතක් ශාන්තියක් අපේක්ෂාවෙන් සිදුකරනු ලබන යාතුකර්ම විශේෂයන් ය. (ලකුණු 02)
ii. සන්නි යකුම, මෙහි රූමත් ළඳක් ගැබිණි කාන්තාවක්, දරුවෙක් ඇතැති මවක් ආදි නාට්‍යමය ලක්ෂණ ඇතුළත් අවස්ථා එකක් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
iii. නූතන නාට්‍යවලට ඉන් ලැබී ඇති පිටිවහල පිළිබඳ කරුණු ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(04) i. නළුවෙකුගේ රංගන කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සිදුකරනු ලබන ක්‍රීඩා වේ. (ලකුණු 02)
ii. අභ්‍යාසය පිළිබඳ අනවබෝධය / සම්පත් හිඟ කම / ඉදිරිපත් වීම ශක්තිය හීන වීම / සබකෝලය ආදී කරුණු සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
iii. කරුණු පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(05) i. නාඩගම් රංග ශෛලියේ විශේෂ ලක්ෂණ හා නූර්ති වල ප්‍රභවය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)
ii. ජෝන් ද සිල්වා, චාල්ස් ඩයස්, සී. දොන් බස්තියන් ආදීන්ගේ කෘතීන් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
iii. නූතන පින්තූර රාමු වේදිකාව, පසුතල අලංකරණය, ඇඳුම් පැළඳුම්, ආලෝකකරණය ආදී නව ප්‍රවණතා නම් කර විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(06) i. නාට්‍යමය පෙළ ප්‍රේක්ෂකයා වෙත ගෙන යන මාධ්‍යයි. / අභිනය යනු ඉදිරියට ගෙනයාමයි. (ලකුණු 02)
ii. වෙනස්කම් පැහැදිලිව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
iii. බාහිර හා අභ්‍යන්තර සමාරෝපය පිළිබඳව සඳහන් කරමින් අභිනය උපකාරී වන ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(07) අදාළ නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)
සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ලකුණු 08)
(මුළු ලකුණු 12)